(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 386.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 අගෝස්තු මස 20 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2679/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'මිල්කෝ' ආයතනයේ උසස් බලධාරීන් කීප දෙනකු එකතු වී, මෙරට කිරි නිෂ්පාදනය සහමුලින්ම වනසා දැමීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බවත්;

(ii) ඔවුන් මීට මාස කීපයකට පෙර, ආයතනයේ සියලු වත්කම් ඇපයට තබා, රුපියල් මිලියන 700ක් වැය කර, දියර කිරි පැකට් සැකසුම් යන්ත්‍ර 2ක් ආනයනය කර ඇති බවත්;

(iii) නැවතත් රුපියල් මිලියන 40ක පමණ ණයක් ගෙන, යන්ත්‍රෝපකරණ ගෙන්වීමට මිල්කෝ සමාගම සැරසෙන බවත්;

(iv) පසුගිය දෙසැම්බර් මාසයේ සිට මේ දක්වා එම ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට බැර විය යුතු මුදල් ගෙවා නැති බවත්;

(v) එහි සැපයුම්කරුවන්ට රුපියල් මිලියන 100කට අධික මුදලක් ණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දූෂිත බලධාරීන්ට එරෙහිව කටයුතු කොට 'මිල්කෝ' ආයතනය රැක ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3279/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JAICA) විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ලද ණය සහ ප්‍රදානයන් සම්බන්ධයෙන්,

(i) ඒවායේ වටිනාකම කොපමණද;

(ii) ණය කාල පරිච්ඡේදය කවරේද;

(iii) සාමාන්‍ය පොලී වියදම කවරේද;

(iv) ණය හෝ ප්‍රදානයන් ලබාදුන් කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3330/'12

3.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2008-2012 කාල සීමාව තුළ,

(i) ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත්වී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ත්‍රී ඝාතන සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත්වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ ස්ත්‍රී දූෂණ හා ස්ත්‍රී ඝාතනවලට අදාළව වරදකරුවන් බවට පත්වූ, දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වරදකරුවන් වෙත ලබා දී ඇති දඬුවම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3923/'13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1985, 1995, 2005 සහ 2012 යන එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ,

(i) පිළිකා රෝගවලට ගොදුරු වී ඇති වයස මාස 01ත් - අවුරුදු 18ත් අතර දරුවන් සංඛ්‍යාව;

(ii) පුද්ගලයින් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගයට ගොදුරු වූ පුද්ගලයින් සංඛ්‍යාව;

(iii) කාන්තාවන් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති කාන්තාවන් සංඛ්‍යාව;

(iv) පුරුෂයින් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති පුරුෂයින් සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සිදුවන මරණ සංඛ්‍යාවෙන් පිළිකා නිසා මිය යන සංඛ්‍යාව කොපමණද;

(ii) එම තත්ත්වය අවම කිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4225/'13

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී ශ්‍රී ලංකා රජය විසින් චීන අපනයන ආනයන බැංකුව (The Export—Import Bank of China) වෙතින් ලබාගෙන ඇති ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ලබාගෙන ඇති ණය මුදල් ලබාගත් දිනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය මුදල සඳහා ගෙවිය යුතු පොලී අනුපාතිකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4464/'13

6\.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන ආරක්ෂිත කාඩ්පත් 11ක් සහ මල්ටිමීඩියා යන්ත්‍ර 02ක් අතුරුදහන් වී තිබේද;

(ii) එසේ නම්, එම අතුරුදහන්වීම් පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඊට වගකිවයුත්තන් හඳුනා ගනු ලැබ තිබේද;

(iii) සිදුවී ඇති අලාභය ඔවුන්ගෙන් අයකර ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් සිද්ධියට අදාළව කුරුඳුවත්ත පොලීසිය විසින් කරගෙන යනු ලබන පරීක්ෂණ මගින් අදාළ උපකරණ හා ද්‍රව්‍ය සොයාගනු ලැබ හෝ වරදකරුවන් හඳුනාගනු ලැබ තිබේද;

(ii) ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයක සිදු වූ මෙම සිදුවීම පිළිබඳව රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4485/'13

7\.

ගරු තිස්ස අත්තනායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බලන්ගොඩ, කල්තොට දිසා රෝහල මේ වන විට අබලන්ව වැසී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) කල්තොට දිසා රෝහලෙන් වෛද්‍ය සේවා ලබා ගන්නා පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම රෝහලෙහි කාර්ය මණ්ඩලයේ දැඩි හිඟයක් පවත්නා බවත් සහ නිසි පරිදි සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැති බවත් පිළිගන්නේද;

(ii) එම රෝහලෙහි සේවය කරනු ලබන වෛද්‍යවරුන්, හෙදියන් සහ අනෙකුත් සේවක සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහලේ අලුතින් ඉදි කළ යුතු සහ පිළිසකර කළ යුතු ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා එම රෝහලට අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සියලු පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4526/'13

8\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, වෙලන්ගොල්ල නිවාස යෝජනා ක්‍රමය තුළ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස යෝජනා ක්‍රමය සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවසක් ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම නිවසක විකුණුම් මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4621/'13

9\.

ගරු සුජීව සේනසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලේසර් කිරණ භාවිතයෙන් භූගතව පවතින නිදන් වස්තු නිරීක්ෂණය කළ හැකි යන්ත්‍රයක් ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්, එය පොලිස් අත්අඩංගුවට පත් වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම යන්ත්‍රය ගෙන්වීම සඳහා ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රබල අයෙකුගේ මැදිහත්වීමක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයාගේ නම කවරේද;

(iii) මෙම ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රබල තැනැත්තාගේ මැදිහත්වීම හේතුවෙන් එම යන්ත්‍රය පිළිබඳ පරීක්ෂණ නවතා දමා තිබේද;

(iv) නොඑසේ නම්, එම පරීක්ෂණවල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ලේසර් යන්ත්‍රය ආනයනය කර ඇති රට කවරේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) ඉහත (අ) හි සඳහන් යන්ත්‍රයට අමතරව මෙරටට ගෙන්වා ඇති එවැනි යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් යන්ත්‍රය හෝ යන්ත්‍ර ගෙන්වීම හේතුවෙන් භූගතව පවතින නිදන් වස්තුවල ආරක්ෂාව සඳහා යම්කිසි බලපෑමක් ඇති විය හැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4632/'13

10\.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට අනවසරයෙන් බීජ වර්ග ආනයනය කරනු ලබන බව දන්නේද;

(ii) එසේ අනවසරයෙන් බීජ ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(iii) අනවසරයෙන් ආනයනය කරනු ලබන බීජ වර්ග කවරේද;

(iv) අනවසරයෙන් බීජ ගෙන්වීමට ඇති අවශ්‍යතාවය කවරේද;

(v) විදේශ රටවලින් බීජ ගෙන්වීම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් සිදු කිරීමට ඇති අපහසුතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනවසරයෙන් බීජ වර්ග ආනයනය කිරීම නිසා ගොවීන් විශාල අපහසුතාවලට පත් වන බව දන්නේද;

(ii) එසේ නම්, එය වැළැක්වීමට හා ඒ පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අනවසරයෙන් බීජ ආනයනය කරන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ හැකියාවක් තිබේද;

(iv) එසේ නම්, අනවසරයෙන් බීජ ආනයනය කරනු ලබන අයට දඬුවම් ලබා දීම සඳහා එම නීති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4759/'14

11.

ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) මේ වන විට ආනයනය කර ඇති කිරි ගවයින් සංඛ්‍යාව කොපමණද;

(iii) කිරි සහ ද්විත්ව කාර්ය එළුවන් ආනයනය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iv) 2013 වර්ෂය වන විට එම එළුවන් ආනයනය කර තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4956/'14

12.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, බත්තුළුඔය - උඩප්පුව මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) මෙම මාර්ගයේ ඉදිකිරීම් පවරා ඇති ආයතනය කවරේද;

(iii) එකී සමාගම වෙත ඉදිකිරීම් පැවරීමේ දී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් අතරමගදී නවතා දැමීමෙන් ජනතාව බලවත් දුෂ්කරතාවකට පත්ව ඇති බව දන්නේද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත මාර්ගයේ ඉදිකිරීම් කටයුතු දීර්ඝ කාලයක් තිස්සේ නතර කර තිබීම නිසා ගමනාගමන කටයුතුවලදී පීඩාවන්ට පත්ව සිටින ජනතාවට සහන සැලසීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5026/'14

13.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් අන්තර්ජාලය ඔස්සේ ඇණවුම් කර ඖෂධ මිලදී ගැනීමේ ප්‍රවනතාවය මෑතක සිට ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවත්;

(ii) එසේ අලෙවි කරනු ලබන බොහෝ ඖෂධ වර්ග ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර නොමැති බවත්;

(iii) අන්තර්ජාලය ඔස්සේ ඇණවුම් කර ලබා ගන්නා ඖෂධ බොහෝ විට වෛද්‍යවරුන්ගේ නිර්දේශයකින් තොරව භාවිතා කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අන්තර්ජාලය ඔස්සේ දේශීය ජනතාවට අලෙවි කරනු ලබන ඖෂධ පිළිබඳව විධිමත් අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ සිදු කරනු ලබන ඖෂධ අලෙවිය නියාමනය කිරීමේ නීතිමය හැකියාවක් මෙරට සෞඛ්‍ය බලධාරීන් හට තිබේද;

(iii) නොඑසේ නම්, වෛද්‍ය නිර්දේශයකින් තොරව අන්තර්ජාලය ඔස්සේ ඖෂධ මිලදී ගැනීම හා එම ඖෂධ භාවිතා කිරීම සම්බන්ධයෙන් පවතින අන්තරායකාරී ස්වභාවය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2686/'12

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ විශ්වවිද්‍යාලයට අයත් පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පීඨයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයට වෙන් කළ ප්‍රතිපාදනවල මුළු වටිනාකම කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයන් 2012 වර්ෂය තුළ එම විශ්වවිද්‍යාලයේ පැවති සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ කරලීම සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3280/'12

15.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට පුහුණුවීමේ පහසුකම් සපයන ලද්දේ කවර ස්ථානයකදීද;

(iii) පුහුණු කාලසීමාව තුළ ඔවුන්ට දීමනාවක් හෝ වැටුපක් ගෙවනු ලැබුවේද;

(iv) ඔවුන්ගේ පුහුණු කාලසීමාව සහ පුහුණුකරුවන් කවරේද;

(v) පුහුණු අත්පොත් ලබාදී තිබුණේද;

(vi) 2013 වර්ෂයේදී බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(vii) උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ වර්තමාන වේතන සහ අනාගත වැටුප් පරිමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යාවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යාවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*13.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---